// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1786/1 - 2012 නොවැම්බර් මස 26 වැනි සඳුදා - 2012.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත**

4(2) උපවගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (මෙහි මින් මතු 'ආයතනය' යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, ආයතනය විසින් මේ සමග නියමයන් තුනක්, ධාරක ජීව විද්‍යාත්මක වත්කම්, අතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි සංසන්දනාත්මක සංඛ්‍යා සහ IFRIC 15 - නිශ්චල දේපළ ඉදිකිරීම් සඳහා ගිවිසුම් ව්‍යවහාරකරණය යන විශේෂිත කේෂත්‍රයන් අමතමින් නිකුත් කර ඇත. 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ අරමුණු සඳහා මෙම නියමයන් පළකරන ලදී. වර්ෂ දෙදහස් දොළහේ ජනවාරි මස පළමුවැනි දින හෝ ඊට පසුව ආරම්භ වන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා මෙම නියමයන් බලාත්මක වේ.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2012 නොවැම්බර් මස 21 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ දී ය.

නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ( SLFRS/ LKAS) සහ වෙනත් සම්බන්ධිත විවරණ 2012 ජනවාරි 1 පටන් බලාත්මක වීමත් සමග ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරී ආයතනයේ පාලක මණ්ඩලය පහත සඳහන් නියමයන් විශේෂිත ක්‍ෂෙත්‍රයන් ඇමතුම් කරමින් නිකුත් කිරීමට තීරණය කරන ලදී.

- ධාරක ජීව විද්‍යාත්මක වත්කම් ;
- අතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි සංසන්දනාත්මක සංඛ්‍යා ;
- IFRIC 15 නිශ්චල දේපළ ඉදිකිරීම් සඳහා ගිවිසුම් ව්‍යවහාරකරණය.

මෙම නියමයන් ව්‍යවහාර කිරීම 2012 ජනවාරි 1 දින හෝ පසුව ආරම්භ වන මූල්‍ය කාල පරිච්ඡේද සඳහා නව SLFRS/ LKAS සමග සමගාමීව ව්‍යාවහාර කළ යුතු ය.

1A - PG 01457 — 345 (2012/11)

*සැ. යු.- අති විශෙෂ ගැසට් අංක 1785/1 කාණ්ඩය අංක 1785/44 න් අවසන් වේ.*

**ධාරක ජීව විද්‍යාත්මක වත්කම් මත නියමයන්**

***පසුබිම :***

2012 ජනවාරි 01, පටන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත, IFRS සමග ආවරණය වී ව්‍යවහාරකරණය සමග, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 41 - කෘෂිකර්මය, එය කෘෂිකාර්මික කටයුත්තකට අදාල වන කල්හි, ජීව විද්‍යාත්මක වත්කම් සහ කෘෂි නිශ්පාදන සඳහා දේශීය සම්බන්ධයේ දී ව්‍යවහාර කරනු ලැබේ. කෘෂිකාර්මික කාර්යයන්, අස්තිත්වයක් විසින් ජීව විද්‍යාත්මක වත්කම්, විකිණීම සඳහා හෝ කෘෂිකාර්මික නිෂ්පාදිතයක් හෝ අමතර ජීව විද්‍යාත්මක වත්කමක් බවට පරිවර්තනය සඳහා, ජීව විද්‍යාත්මක පරිණාමනයක් සහ ජීව විද්‍යාත්මක වත්කමක එළදාව නෙලාගැනීමක් කළමණාකරණය ලෙස ප්‍රමිතය නිර්වචනය කර ඇත.

එසේ හෙයින් මෙම ප්‍රමිතය කෘෂිකාර්මික කාර්යයක් මගින් ආවරණය වන ජීව විද්‍යාත්මක වත්කම් ක්‍රියාශීලීව කළමනාකරණය කරන කල්හි පමණක් ව්‍යවහාර කළ හැකි ය.

එම නිසා LKAS 41 කළමනාකරණය නොකරන වැවිලි කර්මාන්තයක ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ වටිනාකම්කරණයට අවසර දෙනු නොලබයි.

ජාත්‍යන්තර ගිණුම් ප්‍රමිති මණ්ඩලය (IABS) ධාරක ජීව විද්‍යාත්මක වත්කම් සඳහා සාධාරණ අගය කිරීම සලකන ආකාරය නැවත සැළකිල්ලට ගනිමින් සිටින අතර, ධාරක ජීව විද්‍යාත්මක වත්කම් LKAS 16 භාවිතා කරමින් විකල්ප මිණුම් කිරීමකට ඉඩ දෙනු ලබයි.

***විමසීම :***

ISAB මතය අනුව ධාරක ජීව විද්‍යාත්මක වත්කම් සඳහා ඉහත සඳහන් කරන ලද විකල්පය සලකා බලමින්, ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරී ආයතනය ධාරක ජීව විද්‍යාත්මක වත්කම් (උදාහරණ ලෙස තේ, රබර් සහ පොල් ආදී නිත්‍ය වැවිලි) සඳහා සමාන විකල්පයක් LKAS 16 *දේපළ පිරියත සහ උපකරණ* යටතේ ඉඩ හැරීමට තීරණය කරන ලදී.

***නිර්දේශය :***

- පිළියෙල කරන්නන්, ධාරක ජීව විද්‍යාත්මක වත්කම් (උදාහරණ ලෙස, තේ, රබර් සහ පොල් ආදී නිත්‍ය වගාවන් සඳහා) LKAS 16 *දේපළ, පිරියත සහ උපකරණ* භාවිත කරමින් මිණුම් කළ හැකි ය. කෙසේ වෙතත්, පිළියෙල කරන්නන් LKAS 41 - *කෘෂිකර්මය* යටතේ ධාරක ජීව විද්‍යාත්මක වත්කම්වල සාධාරණ වටිනාකම දැක්වීමට අපේක්ෂා කරන්නේ නම් තවදුරටත් එසේ කළ හැකි ය.

- LKAS 41 - *කෘෂිකර්මය* ව්‍යවහාර කරනුයේ කළමනාකරණය කරනු ලබන කෘෂිකාර්මික කාර්යයන් ට පමණක් හෙයින්, ඔවුන්ගේ වැවිලිවල ඇති කළමනාකරණය නොකරන ලද ගස් සාධාරණ වටිනාකමට දැක්වීමට පිළියෙල කරන්නට ඉඩ දෙනු නොලැබේ.

**අතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි සංසන්දනාත්මක සංඛ්‍යා පිළිබඳ නියමයන්**

නව SLFRS සහ LKAS, 2012 ජනවාරි 01 පටන් බලාත්මකවීම සමග, අස්තිත්වයන් විසින් අන්තර් ප්‍රතිඵල LKAS 34 - අතුරු මූල්‍ය වාර්තාකරණය ප්‍රකාර වාර්තා කිරීමට අවශ්‍ය වෙයි.

බොහෝ අස්තිත්ව ප්‍රකාශ කළ කරුණු සහ පරිවර්තන ක්‍රියාවලියට ලැබුණ කෙටි කාල රාමුව සැළකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරී ආයතනය, 2012 ජනවාරි 01 හෝ පසුව ආරම්භ වන ප්‍රථම මුදල් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන කල්හි, පහත සඳහන් ආවස්තික විකල්ප ඉඩහැරීමට තීරණය කරන ලදී.

1. 2012 ජනවාරි 01 පටන් බලාත්මක වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාර (SLFRS/ LKAS) අතුරු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ; හෝ

2. 2012 ජනවාරි 01 ට ආසන්නව ම පැවති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාර, අන්තර් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සමග, කාල පරිච්ඡේදය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට සහ SLFRS/ LKAS පදනම වන ශුද්ධ වත්කම්වලට ඇති බලපෑම හෙළිදරව් කිරීම ; හෝ

3. 2012 ජනවාරි 01 පටන් බලාත්මක ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS/ LKAS) පදනම මත ජංගම කාල පරිච්ඡේදයේ සංඛ්‍යා ඉදිරිපත් කරමින් අන්තර් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන අතර, සංසන්දනාත්මක සංඛ්‍යා 2012 ජනවාරි 01ට ආසන්නව ම පැවති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLASs) යටතේ ඉදිරිපත් කිරීම.

කෙසේ වෙතත්, 2012 ජනවාරි 01 හෝ පසුව ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේද සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS/ LKAS) සම්පූර්ණයෙන් ම පදනම්කර, සමාගම් මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අවශ්‍ය වෙයි. (එනම්, 2012 දෙසැම්බර් 31 හෝ 2013 මාර්තු 31 අවසන් වර්ෂ සඳහා මුල්‍ය ප්‍රකාශන)

IFRIC – 15 **නිශ්චල දේපළ ඉදිකිරීම් සඳහා ගිවිසුම් නියමයන් ව්‍යවහාරකරණය විලම්බිත කිරීම.**

IFRIC – 15 අනුමත කිරීමත් සමග, නිශ්චල දේපළ ඉදිකිරීම් සෘජුවම හෝ උපකොන්ත්‍රාත්කරුවන් මඟින් භාරගනු ලබන අස්තිත්ව, අයභාර සහ සම්බන්ධිත වියදම් හඳුනාගැනීම මත අදහස් ප්‍රකාශ කර ඇත.

අයභාර හඳුනාගැනීමේ මෑතක වර්ධනයන් - පියවර පහ ආකෘතිය අයභාර හඳුනාගැනීම මත වඩා පැහැදිලි තත්ත්වයක් ගෙන එනු ඇත යන්න සලකාබැලීමේ දී ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරී ආයතනය, පියවර පහ ආකෘතිය ක්‍රියාවට නැගෙනතුරු අස්තිත්වයන් සඳහා IFRIC – 15 ව්‍යවහාරකරණය විලම්බිත කිරීමේ විකල්පයට ඉඩහැරීමට තීරණය කර ඇත. කෙසේ වෙතත්, ඉහත සඳහන් විකල්පය භාවිතාකරන සමාගම් එම කරුණ මුල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු ය.

12 - 248

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.